පෙසන, න. යැවීම. Sending off.
පෙසනකාරී, ඉ. වැඩ පණිවුඩ කරන්නී. Maid servant.
පෙසෙතුං, නි. යවන්ට. To send.
පොථෙත්වා = පොළා; ගසාදමා. Having shaken off.
පොථිතට්ඨාන, න. බැටදුන් තැන. Beaten place.
පොථියමාන, 3. පහරදෙනු ලබන. Being beaten.
පොථෙති = බැටදෙයි. පහරදෙයි. Beats.
පොස, පු. පුරුෂයා. A man.
පොසයි = පෝෂණය කෙළේය. He brought up.
පොසාපිත, 3. පෝෂණය කරවූ. Made to bring up.
පොසාවනික, න. පෝෂණයට මිල. Money for bringing one up..
පොසිතබ්බ, පොසෙතබ්බ, 3. පෝෂණය කළ යුතු. Should be brought up.
ඵරි = පැතුරුණේය. It pervaded.
ඵලාඵල, න. ගෙඩිවගී. Various kinds of fruits.

ඵලි = පැළුණේය. It burst.
ඵලෙය්‍ය = පැළෙන්නේය. Would have burst.
ඵාණිත, න. පැණි හෝ හකුරු. Treacle or juggery.
ඵාල, ඵාලක, න. නගුල්නලය. Plough-share.
ඵාසුක, න. පහසුව. Ease; 3. පහසු. easy.
ඵාසුකඨාන, න. පහසු තැන. Convenient place.
ඵුඨ, 3. ස්පර්ශකරනලද. Touched by.
ඵුසති, ඵුසාති = ස්පර්ශ කෙරේ. He touches.
ඵුසිත්වා = ස්පර්ශකොට. Having touched.
බක, පු. කොකා, A crane.
බන්ධන, න. බැම්ම; බැඳීම. Binding; a bond.
බන්ධනාගාර, න. සිරගෙය. Prison.
බන්ධයිස්සාමි = බන්දවන්නෙමි. I will make bind.
බන්ධි = බැන්දේය. He bound.
බල, න. ශක්තිය. Power.
බලවසිනෙහ, පු. බලවත් ප්‍රේමය. Strong attachment.
බලිකම්ම, න. බිලිදීම, An oblation.
බහු, බහුක, 3. බොහෝ. Much; many.
බහුතර, 3. ඉතා බොහෝ. Very much; very many.
බහූපකාර, 3. බොහෝ උපකාර ඇති. Very helpful.
බාලක, පු. බාල දරුවා. A child.
බාලතා, ඉ. අඥාන බව. Folly.
බාලිසික, පු. බිලිබාන්නා. Fisherman.
බාවෙරුරඨ, න. බාවෙරු රට. Baveria.
බාහා, ඉ. අතේ උඩ කොටස. The arm.
බාහිර, 3. පිටතවූ. Outer.
බාහිරතො, නි. පිටතින්. From outside.
බාළ්හගිලාන, 3. දැඩිසේ ගිලන්වූ. Seriously ill.
බිල, න. සිදුර. A den or hole.
බුද්ධඞ්කුර, පු. බෝසත්. One who is destined to be a Buddha.
බුද්ධභූත, 3. බුදුවූ. One who has become a Buddha.
බුද්ධලීළ්හා, ඉ. බුද්ධ වේශය. Grace of a Buddha.
බුද්ධුපට්ඨාක, 3. බුදුන්ට උපස්ථාන කරන. Attending the Buddha.
බුධ, පු. පණ්ඩිතයා. A wise man.
බොධිතල, න. බෝමැඩ. The ground under a Bo-tree.
බොධෙතුං, නි. අවබෝධ කරවන්ට. To enlighten.
බ්‍රහ්මචරියා, ඉ. උසස් හැසිරීම. Religious life.

බ්‍රෑහි = කියව. Tell me.
භක්ඛ, 3. කෑයුතු. What should be eaten.
භජ්ජිත, 3. බදිනලද. Fried or roasted.
භඤ්ජ, භඤ්ජක, පු. බිඳින්නා. One who breaks.
භඤ්ජන්ත, 3. බිඳින; බිඳිමින්. Breaking off.
භණති = කියයි. He says.
භණෙ, නි. බොල; බාන්. O man!
භණ්ඩාගාර, න. බඩු ගබඩාව. Store-house.
භති, ඉ. වැටුප්; පඩි. Wages.
භතිමත්තං = වැටුප් පමණත්. Even the wages.
භත්තකිච්ච, න. බත් කිස; ආහාර ගැන්ම. Taking of meals
භත්තපුට, න. බත් මුල. A parcel of boiled rice.
භද්දක, 3. යහපත්. Of good nature.
භද්දෙ (ආලපන), සොඳුර. Dear Madam.
භන්තෙ, (ආලපන), ස්වාමීනි. Reverend Sir.
භමරගණ, පු. බමර සමූහයා. A swarm of wasps.
භයප්පත්ත, 3. භයට පැමිණි. Afraid.
භයජනන, 3. භය උපදවන. Frightful.
භවිතබ්බ, 3. වියයුතු. What should happen.
භවිතුං, නි. වෙන්ට. To be or become.
භවෙය්‍ය = වන්නේනම්. If it would happen.
භස්සන්ත; භස්සමාන, 3. බසින; බසිමින්. Descending.
භාග, පු. කොටස. A portion.
භාජන, න. භාජනය; බෙදීම. A vessel; distribution.
භාතික, භාතු, පු. සහෝදරයා. Brother.
භායති = භයවේ. He fears.
භාරිය, 3. බරපතල. Serious.
භාසා, ඉ. භාෂාව. Language.
භික්ඛා, ඉ. ආහාරය; පිඩු සිඟීම. Food.
භික්ඛුසංඝ, පු. භික්ෂු සමූහය. Congregation of monks.
භිජ්ජි = බිඳුණේය. It broke itself.
භිත්ති, ඉ. බිත්තිය. A wall.
භින්දාපෙත්වා = බින්දවා. Having caused to break.
භින්දි = බින්දේය. He broke (it).
භීත, 3. බියපත්වූ. Afraid.
භීයොසොමත්තාය, නි. බොහෝසේ. Exceedingly.
භුත්ත, 3. අනුභව කළ. Eaten.
(8)

භුස්සන්ත, බුරමින්. Barking.
භුස්සිත්වා, භුංකරිත්වා = බුරා. Havaing barked.
භූමිභාග, පු. බිම් කොටස. A plot of land.
භෙරිවාදක, පු. බෙරගසන්නා. Drummer.
භෙසජ්ජ, න. බෙහෙත. Medicine.
භොග, පු. ධනය; සර්ප ශරීරය. Wealth; the body of a serpent.
භොගක්ඛන්ධ, පු. ධන රාශිය. Great quantity of wealth.
භොජන භණ්ඩක, න. පිඟන් බඩු. Utensils used in eating.
භොජනීය, න. කැයුතුදෙය. Something to be eaten.
භොජෙත්වා = වළඳවා; කවා. Having fed.
මක්කට, පු. වඳුරා. Mcnkey.
මක්ඛිත, 3. තැවරුණු. Smeared with.
මක්ඛෙත්වා = තවරා. Having anointed or smeared with.
මග්ගකිලන්ත, 3. ගමනින් වෙහෙසට පත්. Wearied of journey.
මග්ගමූළ්හ, 3. මංමුළාවූ. One who has lost his path.
මඞ්කුභාව, පු. ඇකුළුණු බව. Downcastness.
මඞ්ගල, න. මගුල; උත්සවය; ශුභ දෙය. Marriage; festival; auspicious thing.
මඞ්ගල-සම්මත, 3. ශුභයයි සම්මතවූ. Accepted as auspicious.
මඞ්ගල සංයුත්ත, 3. ශුභයෙන් යුත්. Auspicious.
මඞ්ගල සාලවන, න. රාජකීය සල්උයන. Royal sal-grove.
මච්ඡරිය, න. මසුරුකම, 3. මසුරුවූ. Avarice; miserly.
මච්ඡරියභාව, පු. මසුරු බව. Niggardliness.
මච්ඡරී, පු. මසුරා. A miser.
මජ්ඣත්ත, 3. මැදහත්. Impartial.
මජ්ඣත්තතර, 3. ඉතා මැදහත්. More impartial.
මඤ්චක, පු. කුඩා ඇඳ. Small bed.
මඤ්චපරායණ, 3. ඇඳෙන් නැගිටිය නොහැකි. Confined to bed.
මඤ්ජුභාණී, පු. මිහිරි කථා ඇත්තා. One who speaks sweetly.
මඤ්ඤමාන, 3. හඟිමින්; හඟින. Deeming; thinking.
මඤ්ඤිස්සති = හඟින්නේය. He will think.
මඤ්ඤෙ, නි. හඟිමි. Methinks.
මට්ඨ, 3. මට්ටම්වූ. Smoothed.
මණිගුළ, පු. මැණික් ගුළිය. A ball of gem.
මණිරතන, න. වටිනා මැණික. A precious jewel.
මණ්ඩල, න. වට දෙය; සමූහය. A disk; a committee.
මණ්ඩලපීඨිකා, ඉ. වටකුරු මේසය. A circular table.

මණ්ඩලමාල, පු. වට වේදිකාව. Circular pavilion.
මතකලෙබර, න. මළ සිරුර. Dead body.
මතපුබ්බ, 3. මැරී තිබෙන. One who has dead once before.
මතමූසික, පු. මළ මීයා. Dead mouse.
මත්තා, ඉ. ප්‍රමාණය. Quantity; size.
මත්තිකාපත්ත, පු. මැටි පාත්‍රය. Earthenware bowl.
මද්දනක, 3. මඩින; මඩිමින්. Crushing or subjugating.
මද්දන, න. Subjection; trampling.
මද්දනභාව, පු. මඩින බව. The fact that one would trample.
මද්දිත්වා = මැඩ; පාගා. Having trampled.
මධුපටල, න. මීවදය. Bee-hive.
මධුරස්සර, පු. මිහිරි සවරය; Sweet voice.
මධුලාජ, පු. මීපැණි දැමූ පොරි. Fried corn mixed with honey.
මනාපජාතික, 3. ප්‍රිය සවභාව ඇති. Pleasing; charming.
මනුස්සට්ඨි, න. මිනිස් ඇටය. A human bone.
මනුස්සමල, න. මිනිස් කිලුට. Impurity of a human being.
මනොසිලාතල, න. සිරියල්තලාව. A plateau of red arsenic.
මන්ත, පු. න. මන්ත්‍රය. A charm.
මන්තණ, න. කථාකිරීම; කුමන්ත්‍රණය. Discussion; a plot.
මන්තෙසි = සාකච්ඡා කෙළේය. He discussed.
මන්ද, 3. අඩු; අල්ප. Less; slow.
මන්දාරවපුප්ඵ, න. මදාරා මල්. A kind of flower.
මරණපණ්ණ, න. මරණ ලියුම. A document giving power to kiil [someone.
මරණසමය, පු. මැරෙන කාලය. Time of death.
මරිච, න. මිරිස්. Chillies or pepper.
මරිචචුණ්ණ, න. ගම්මිරිස්කුඩු. Pepper-powder.
මලය, න. කඳුරට. Hilly district.
මල්ල, පු. මල්ල රටවැසියා. A man of Malla clan.
මසි, පු. දැලි. Soot.
මහප්ඵල, 3. මහත් විපාක ඇති. Rich in results.
මහාජන, පු. මහජනයා. The public.
මහාතල, න. මහමිදුල. Extensive courtyard.
මහානුභාව, 3. මහත් ආනුභාව ඇති. Of great majesty.
මහාපුරිස, පු. ශ්‍රෙෂ්ඨ පුරුෂයා. Great person.
මහාමග්ග, පු. මහපාර. Main road.
මහාරහ, 3. ඉතා වටිනා. Very precious.

මහාවිරව, පු. මහත් ශබ්දය. Great noise.
මහාසමණ, පු. උසස් ශ්‍රමණයා. The great sage.
මහාසම්පත්ති, ඉ. මහත් සම්පත. Immense wealth.
මහාසුසාන, න. මහසොහොන. Big cemetery.
මහීපති, පු. රජ. King.
මා කරි = නොකරව. Do not.
මා සොචි = ශෝක නොකරව. Don't lament.
මාණව, මාණවක, පු. තරුණයා. Young man.
මාතුකුච්ඡි, පු. ඉ. මවුකුස. Mother's womb.
මානස, න. සිත. The mind: 3. සිතැති. Having the thought of
මානිත, 3. බුහුමන් කරනලද. Respected by.
මානෙති = ගෞරව කරයි. He respects.
මාපෙති = මවයි. Creates.
මාරක, පු. මරන්නා. One who kills.
මාරාපන, න. මැරවීම. Causing to be killed.
මාරාපෙතුං, නි. මරවන්ට. To cause to kill.
මාරිස, 3. (මා වැනි) පින්වත්නි. Sir: Sirs.
මාලාකාර, පු. මල්දම් සාදන්නා. Garland-maker.
මාසක, පු. පණම. An anna.
මිත්තපදූසක, පු. මිත්‍රද්‍රෝහියා. A treacherous friend.
මිත්තසන්ථව, පු. මිත්‍රකම බැඳීම. Association with a friend.
මිස්සිත, 3. මිශ්‍රකළ. Mixed with.
මුඛතුණ්ඩක,, න. හොටය. The beak.
මුඛධොවන, න. මූණ සේදීම. Washing of the face.
මුඛරභාව, පු. දෙඩමලු බව. Talkativeness.
මුඛවට්ටි, ඉ. මුවවිට; ගැටිය. The rim or brim.
මුඛවාත, පු. කටින් පිඹින වාතය. Blowing from the mouth.
මුග්ගබීජ, න. මුංඇටය. A seed of green pea.
මුග්ගර, පු. මුගුර; පොල්ල. A cudgel.
මුඤ්චනුපාය, පු. නිදහස්වෙන පිළිවෙළ. Way to release oneself.
මුඤ්චාපෙසි = මිදෙව්වේය. He caused to be released.
මුඤ්චි = මුදහැරියේය. He released.
මුඤ්චිත්වා = මුද. Having released.
මුඤ්චෙතුං, නි. මුදවන්ට. To make release.
මුත්ත, 3. මිදුණු; නිදහස්වූ. Freed from.
මුත්තා, ඉ. මුතු. Pearl.
මුදු, මුදුක, 3. මොලොක්. Soft; mild.

මුඩා, පු. හිස. The head.
මුසා, නි. බොරුව. Falsehood lie.
මුස්සති = මුලාවේ; සිහිනැතිවේ. He forgets or goes astray.
මුහුත්ත, පු. මොහොත. A moment.
මූලකන්ද, පු. අල. Yams.
මූසිකවච්ච, න. මීලඩ. Mice-dung.
මෙත්ති, ඉ. මෛත්‍රිය. Benevolence.
මෙධාවී, පු. නුවණැත්තා. Wise man.
මොක්ඛ, පු. නිදහස්වීම. Release; freedom.
මොචෙතුකාම, 3. මුදනු කැමති. Willing to release.
මොචෙත්වා = මුද; නිදහස්කොට. Having released.
මොචෙන්ත, 3. මුදන; මුදමින්. Releasing.
මොරයොනි, ඉ. මොනර ජාතිය. The species of peacocks.
මොළි, ඉ. කොණ්ඩය. Top-knot of hair.
ය, 3. යම්. Which. (Relative.)
යක්ඛ, පු. යක්ෂයා. Demon.
යඬාලය විහාර, පු. යටාලවෙහෙර. Name of a monastery in Ruhuna.
යට්ඨි, ඉ. හැරමිටිය; සැරයටිය. Walking stick.
යත්ථ, නි. යම්තැනක. Wherever.
යථා, නි. යම්සේ. As; like; just as.
යථා පුරෙ = පෙර මෙන්. As before.
යථාරුචිං, ක්‍රි. වි. කැමති පරිදි· As one likes.
යථාසම්මන්තිත, 3. සාකච්ඡාකළ පරිදි. According to former
යථාසුඛ, 3. පහසු පරිදි පවත්නා. Convenient. [agreement.
යද, නි. යම්කලක. When. (Relative)
යන්ත, න. යන්ත්‍රය. A machine.
යමකසාල, පු. බද සල්ගස්. Twin Sal trees.
යස, පු. න. පිරිවර; කීර්තිය. Highest fame.
යසවන්තු, 3. කීර්තිය හෝ පිරිස් ඇති. Having fame or followers.
යාග, පු. යාගය. An oblation.
යාගහෙතු, නි. යාග පිණිස. For sacrifice.
යාගු, ඉ. කැඳ. Rice-gruel.
යාචක, පු. ඉල්වන්නා. A beggar.
යාචති = ඉල්වයි. He begs.
යාචන, න. ඉල්ලීම. Begging.

යාචිතපුබ්බ, 3. ඉල්ලා තිබෙන. Having begged before.
යාති = යයි. He goes.
යාන; යානක, න. රථාදි වාහනය. A vehicle.
යාව, නි. යම්තාක්. As long as.
යාවජීවං, ක්‍රි. වි. ජීවිතාන්තය දක්වා. As long as one's life lasts.
යාවදත්ථං, ක්‍රි. වි. සෑහෙනතාක්. As much as one wishes.
යුග, න. යුගලය; ජෝඩුව. A pair.
යුත්තරූප, 3. යොග්‍යාකාර ඇති. Suitable.
යොග්ග, න. වාහනය; කරත්තය; A vehicle.
යොජන, න. යොදුන. A measure of length which is about seven [miles.
යොජාපෙත්වා = යොදවා. Having employed.
යොනි, ඉ. ජාතිය; වර්ගය. Species.
රක්ඛිතුං, නි. රකින්ට. To protect.
රක්ඛිය, 3. රැක්කයුතු; රැක්ක හැකි. Fit to be protected.
රච්ඡා, ඉ; වීථිය. Street.
රජත, න. රිදී. Silver.
රජතදාම, පු. රිදී දම්වැල. Silver chain.
රජතපට්ට, න. රිදී තහඩුව. Silver-plate.
රජ්ජාභිකාමිනී, ඉ. රාජ්‍යය කැමැත්තී. Willing to occupy the throne.
රජ්ජු, ඉ: රැහැ; ලණුව. A rope.
රතන, න. රියන; රත්න වර්ගය. A cubit; a precious thing.
රත්තන්ධකාර, පු. රෑ අඳුර. Darkness of the night.
රත්තිභාග, පු. රාත්‍රි කාලය. Night-time.
රථ, පු. රථය. Carriage.
රවමාන, 3. හඬලන; කෑගසන. Making a sound.
රාජකකුධභණ්ඩ, න. රජෙකුට අයත් ඔටුන්න ආදී ප්‍රධාන භාණ්ඩ [පස. Regalia
රාජකුමාර, පු. රජ කුමරා. A prince.
රාජකුල, න. රජ පවුල. The royal family or the royal palace.
රාජඞ්ගණ, න. රජ මිදුල. Palace-court.
රාජගෙහ, න. රජ ගෙය. Palace.
රාජපුරිස, පු. රාජ භටයා. An official.
රාජසුත, පු. රජුගේ පුත්‍රයා. King's son.
රාජුය්‍යාන, න. රජ උයන. Royal garden.
රාජුපට්ඨාන, න. රජු වෙත එළඹ සිටීම. Attending to a king.
රාසි, ඉ. සමූහය; ගොඩ. A heap.
රාහුමුඛ, න. රාහුගේ කට. Mouth of Rahu, the Asura king.
රුක්ඛතච, පු. ගසේ පොත්ත. Bark of a tree.

රුක්ඛබිල, න. ගස් බෙනය. Hollow in a tree.
රුච්චනක, 3. කැමතිවූ. Pleasing to.
රුජති = රිදේ. It ails or aches.
රුජිංසු = රිදුනාහ. They felt pain.
රූප, න. රූපය. Figure; image.
රූපග්ගප්පත්ත, 3. රූපයෙන් අගතැන්පත්, Very handsome.
රොග, පු. රෝගය. Disease.
රොචෙති = කැමති වේ. He likes.
රොචෙත්වා = කැමතිවී. Having one's consent.
රොදමාන, 3. හඬන; හඬමින්. Crying.
රොදිත්වා = හඬා. Having cried.
රොදිතුං, නි. අඬන්ට. To cry.
රොහණාභිමුඛ, 3. රුහුණට අභිමුඛවූ. Facing Ruhuna.
ලක්ඛ, න. ලක්‍ෂය: ඉලක්කය. A hundred thousand; a target.
ලක්ඛණ, න. ලකුණ. A sign or mark.
ලක්ඛණපාඨක, 3. ලකුණු බලා ශුභා ශුභ කියන්නා. An expert in [interpreting signs.
ලක්ඛණ සම්පත්ති, ඉ. ශුභ ලකුණුවලින් යුක්තවීම. Excellency of [marks.
ලඞ්කා, ඉ. ලක්දිව. Ceylon.
ලංඝිත, 3. උඩින් පැනගිය. Jumped over.
ලංඝෙත්වා = උඩින් පැන. Having jumped over.
ලජ්ජා, ඉ. ලජ්ජාව. Shyness.
ලද්ධ, 3. ලැබූ. Got or received.
ලද්ධබ්බ, 3. ලැබිය යුතු. What should be received.
ලද්ධාකාර, පු. ලැබූ ආකාරය. The way one had got (some-thing).
ලද්ධූපසම්පද, 3. ලැබූ උපසම්පද ඇති. One who has received higher [ordination.
ලද්ධුං, නි. ලබන්ට. To get.
ලබ්භා, නි. ලැබිය හැකිය. It is possible.
ලභති = ලබයි. He gets.
ලභනදිවස, පු. ලබන දවස. Receiving day.
ලභන්ත, 3. ලබන; ලබමින්. Receiving.
ලභෙය්‍ය = ලබන්නේ නම්. If he would get.
ලසිකා, ඉ. ශරීරසන්ධි ලාටුව. Synovic fluid.
ලහුං, ක්‍රි. වි. වහා. Quickly.
ලාඛා, ඉ. ලාකඩ. Sealing wax.
ලාභ, පු. ලැබීම; ලාභය. Gain.
ලාභග්ග, පු. උතුම් ලාභය. The highest gain.

ලාභසක්කාර, පු. ලාභය හා ගෞරවය. Gain and honour.
ලාලාකිලින්නගත්ත, 3. කෙලෙන් තෙත් සිරුරු ඇති. Having a body smeard with saliva.
ලිඛි = ලිවේය. He wrote.
ලිඛිත්වා = ලියා. Having written.
ලුඤ්චිත්වා = ඇද කඩා. Having singed.
ලුද්දක, පු. වැද්ද. Hunter.
ලෙඩ්ඩු, පු. මැටිකැටිය. A clod of earth.
ලොක, පු. ලොව; ලෝවැසියා. The world; the mankind.
ලොණ, න. ලුණු. Salt.
ලොණසක්ඛරා, ඉ. ලුණු පුපුර. A crystal of salt.
ලොභ, පු. ලෝභය; ආශාව. Greed.
ලොල, 3. ලොල්වූ; කැදර. Greedy.
වක්ඛති, ක්‍රි. කියන්නේය. He will say.
වචන, න. කීම; වචනය. Saying; a word.
වච්චකූප, පු. අශුචි වල. A privy pit.
වජ, පු. ගාල. Cow-pen.
වජද්වාර, න. ගාල් දෙරටුව. Gate of a cattle-fold.
වජිරාවුධ, න. දියමන්ති ආයුධය. A mace of diamond.
වජ්ජෙති = දුරුකරයි; තූර්යවාදනය කරයි. Avoids: sounds a musical instrument.
වඤ්චක, පු. වංචාකාරයා. A cheat.
වඤ්චිතභාව, පු. වංචාකළ බව. The fact that one has been cheated.
වඤ්චෙතුකාම, 3. රවටනු කැමති. Willing to cheat.
වඤ්චෙත්වා = වංචාකොට. Having deceived.
වටරුක්ඛ, පු. නුග ගස. Banyan tree.
වට්ටක, පු. වටුවා. A quail.
වට්ටකයොනි, ඉ. වටු ජාතිය. The specise of quail.
වඩ්ඪන්ත, 3. වැඩෙන; වැඩෙමින්. Growing.
වඩ්ඪාපෙසි = වැඩෙන්ට සැලැස්විය. He caused to increase.
වඩ්ඪි = වැඩුණි. It grew.
වඩ්ඪෙත්වා = වැඩිකොට. Having caused to increase.
වණ්ණෙති = වර්ණනා කරයි. Praises or explains.
වත, නි. ඒකාන්තයෙන්. Surely.
වත්තුං, නි. කියන්ට. To say.
වත්ථ, න. වස්ත්‍රය. Cloth.
වත්ථාලඞ්කාර, පු. ඇඳුම් පැළඳුම්. Clothes and ornaments.
වත්වා = කියා. Having told.

**වදන්ත**, 3. කියන; කියමින්. Saying.
**වදමානා**, ඉ. කියන්නී. Saying (woman).
**වදෙති** = කියයි. He says.
**වදෙය්‍ය**, ක්‍රි. කියන්නේ නම්. If he would say.
**වධ**, පු. පීඩාව; දඬුවම. Punishment; trouble.
**වධාය** = නැසීම පිණිස. To kill.
**වනසණ්ඩ**, පු. කුඩා වනය. Jungle.
**වන්දාපෙතුං**, නි. වන්දවන්ට. To make bow down.
**වන්දිතබ්බයුත්තක**, 3. වැන්දයුතු. Fit to be bowed down.
**වන්දිත්වා** = වැඳ. Having honoured.
**වයප්පත්ත**, 3. වැඩිවිය පැමිණි. Come of age.
**වරගාම**, පු. තෑගි ලැබූ ගම. A village received as a present.
**වරණකට්ඨ**, න. ලුනුවරණ ලී. The wood or stick of Varana tree.
**වරණරුක්ඛ**, පු. ලුණුවරණ ගස. The tree Crataeva Roxburghii.
**වරභෝජන**, න. උතුම් ආහාරය. Delicious food.
**වරිය**, 3· වඩා උතුම්. Nobler.
**වලඤ්ජෙය්‍යාසි** = පරිභොග කරන්නෙහි. You shall use.
**වසන**, න. විසීම. Living; residing.
**වසනට්ඨාන**, න. වසන තැන. Abode.
**වසන්ත**, වසමාන, 3. වසමින්; වාසයකරන. Living in.
**වසාපෙති** = වාසය කරවයි. Makes to dwell.
**වසි** = විසුවේය. He lived.
**වස්ස**, න. පු. අවුරුද්ද. Year; න. වැස්ස. rain.
**වස්සන්ත**, 3. වසිමින්; හඬලමින්. Raining or cooing.
**වස්සසත**, න. අවුරුදු සියය. A century.
**වස්සාවාස**, පු. වස් විසීම. Spending of the rainy season.
**වස්සිත**, න. හැඬලීම; පක්ෂි හඬ. Sounding of a bird.
**වස්සිත්වා** = හඬලා; වැහැලා. Having rained or cooed.
**වහිස්සති** = උසුළන්නේය. He will bear.
**වංස**, පු. කුලය; උණ ගස. A clan; a bamboo tree.
**වංසපෙසිකා**, ඉ. උණ පළුව. Split bamboo.
**වා**, නි. හෝ; නොහොත්. Or.
**වාචෙති** = කියවයි. He reads or makes to recite.
**වාතපාන**, න. ජනේලය. Window.
**වාතාවරණ**, න. වාතය වළක්වන දෙය, Screen for the wind.
**වාදිත**, න. බෙර ආදිය ගැසීම. Sounding of musical instruments.

වාම, 3. වම්. (පසට අයත්). Left (side.)
වාමපස්ස, පු. වම් පැත්ත. Left side.
වාමහත්ථ, පු. වමත. Left hand.
වායමන්ත, 3. උත්සාහ කරන. Striving.
වායමිත්වා = උත්සාහ කොට. Having strived.
වායස, පු. කවුඩා. A crow.
වායාම, පු. උත්සාහය. Endeavour; exertion.
වාර, පු. වාරය. Turn; occasion.
වාරක, පු. පැන් වත්කරන භාජනය. A jar or jug.
වාරියමාන, 3. වලක්වනු ලබන. Being prevented.
වාලිකාපුලින, න. වැලි තලාව. Sand bed.
වාසයි; වාසෙසි = වාසය කරවිය. He made to dwell.
වාසි, ඉ. වෑය. An adze.
වාසිඪ, 3. වසිඪගේ පරම්පරාවෙහිවූ. Of the clan of Vasittha.
වාළමිග, පු. චණ්ඩ මෘගයා. A beast of prey.
වාළවිජනී, ඉ. සෙමෙර වලිගය. A fan made of yak's tail.
විකාර, පු. විකාරය; වෙනස. Change; alteration.
විකාල, පු. නොකාලය. Improper time.
විකිරන්ත, 3. විසුරුවන. Scattering.
විකිරිත්වා = විසුරුවා. Having scattered.
විකූජන්ත, 3. නාදකරන. Cooing; sounding.
වික්කය, පු. විකිණීම. Sale.
වික්කිණන්ත, 3. විකුණන. Selling.
වික්කීත, 3. විකුණූ. Sold.
විචරති = හැසිරේ. He wanders about.
විචිත්ත, 3. විසිතුරුවූ. Variegated.
විජාත, 3. වැදූ. Given birth to.
විජායති = වදයි. She gives birth to.
විජායනකාල, පු. වදන කාලය. Time of child-birth.
විජිත, න. රාජ්‍යය. Kingdom.
විජ්ඣන්ත, 3. විදින; විදිමින්. Shooting at.
විජ්ඣායි, ක්‍රි. නිවී ගියේය. It went out (as fire).
විජ්ඣි, ක්‍රි. විද්දේය. He shot at.
විජ්ඣියමාන, 3. විදිනු ලබන. Being shot at.
විඤ්ඤුතා, ඉ. නුවණැති බව; වැඩිවිය. Discretion; age of puberty.
විටප, පු. අත්ත; අතුබෙලය. A branch or a fork of a branch.
විත්ථාර, පු. විස්තරය. Description.

විද්ධ, 3. විදනලද. Being shot at.
විධුනිත්වා = ගසාදමා. Having shaken off.
විනාස, පු. විනාශය. Loss; destruction.
විනාසිත, 3. විනාශකළ. Destroyed by.
විනිච්ඡය, පු. තීන්දුව. Decision; judgement.
විනිච්ඡයට්ඨාන, න. විනිශ්චය ශාලාව. Low-court.
විනිච්ඡයාමච්ච, පු. නඩු විසඳන ඇමතියා. A judge.
විනිච්ඡිත, 3. විසඳනලද. Decided or investigated.
විනිච්ඡිනාථ. ක්‍රි. විසඳුව මැනවි. Kindly try (my case).
විපස්සනා, ඉ. විශෙෂ ඥනය. Inward vision.
විප්පකාර, පු. විකාර–බලනු.
විප්පකිරිත්වා = විසුරුවා. Having scattered.
විප්පලපන්ති, ඉ. විලාප කියන්නී. Wailing (woman).
විප්පවිද්ධ, 3. විසුරුවා දමූ. Scattered about.
විප්පසන්න, 3. ඉතා පිරිසිදු. Very clear or bright.
විභව, පු. සම්පත. Wealth.
විභූතිසම්පන්න, 3. සම්පත්තීන් යුක්තවූ. Splendid.
විභූසිත, 3. සැරසූ. Decorated (with).
විමාන, න. මාලිගාව. Mansion.
විමුඛ, 3. අන් දෙසකට අභිමුඛවූ. Turned away from.
විය, නි. මෙන්. As; like (that).
විරජ, 3. කිලුටු නැති. Free from defilement.
විරවිත්වා = කෑගසා. Having shouted aloud.
විරත්තචිත්තතා, ඉ. නොඇලුණු සිත් ඇති බව. Unattachmen
විලිම්පාපෙත්වා = ගාවා; ආලේප කරවා. Having smeard with.
විලීයි, ක්‍රි. දියවී ගියේය. It dissolved.
විලුම්පාපෙති = කොල්ලකවයි. Causes to plunder.
විලොකිත, න. වටපිට බැලීම. Looking around.
විවට, 3. විවෘතකළ. Opened.
විවටමත්තෙ = හැරි කෙනෙහි. As soon as it was opened.
විවටමුඛ, 3. කට විදහාගත්. With mouth open.
විවදන්ත, 3. විවාද කරන. Contending; disputing.
විවරාපෙතුං, නි. විවෘත කරවන්ට. To make open.
විවරිත්වා = හැර; විවෘතකොට. Having opened.
විවරි = හැරියේය. He opened.
විවාද, විවාදක, පු. විරුද්ධවාදය;. කලහය. Dispute.

විවාහ, පු. ස්ත්‍රියක් පුරුෂයකුට පාවාදීම. To bring in a marriage.
විස, පු. න, විෂය. Poison.
විසද, 3. ප්‍රකට වූ. Clear, manifest.
විසපීත, 3. විෂ පෙවූ. Dipped into poison.
විසමචක්ඛුල, 3. සමනොවූ ඇස් ඇති. Having squint eyes.
විසහි, ක්‍රි. හැකිවිය. He was able.
විසෙස, පු. වෙනස. Difference.
විසුං, නි. වෙන්ව, Separately.
විස්සජ්ජන, න. වියදම් කිරීම; ප්‍රශ්න විසඳීම; පිටත්කිරීම. Spending; [answering; sending off.
විස්සජ්ජාපෙත්වා = අත්හරවා. Having caused to leave off.
විස්සජ්ජිත, විස්සට්ඨ, 3. වියදම්කළ; අත්හැරි; විසඳූ. Spent; left off [answered.
විස්සජ්ජෙසි = යැවීය; හැරියේය. He sent off or spent.
විස්සාසික, 3. විශ්වාස ඇති. Confident.
විස්සුත, 3. ප්‍රකටවූ. Well-known.
විහත, 3. තෙළූ (කපු ආදිය). Carded (cotten, etc).
විහරති = වාසය කරයි. He lives or dwells.
විහරන්ත, 3. වාසය කරන. Dwelling in.
විහාර, පු. ආරාමය. Monastery.
විහෙසා, ඉ. පීඩාව; වෙහෙස. Worry vexation.
වීජයමාන, 3. පවන්සලන. Fanning.
වීජෙත්වා = පවන් සලා. Having fanned.
වීතමල, 3. පහවූ කිලුටු ඇති. Passionless; pure.
වීතිනාමෙත්වා = කල් යවා. Having spent (time).
වීතිසාරෙත්වා = අවසන්කොට. Having finished.
වීමංසති = පරීක්ෂණය කරයි. Investigates.
වීමංසන්ත, 3. විමසන; විමසමින්. Investigating.
වුච්චමාන, 3. කියනුලබන. Being told (by).
වුෂ්ටිකාල, පු. වැසි කාලය. Rainy season.
වුත්තනය, පු. කී ක්‍රමය. The way which has been explained.
වුත්ථවස්ස, 3. වස්විසූ. One who has spent the rainy season.
වූපසන්ත, 3. සංසිඳුණු. Calmed; allayed.
වෙග, පු. වේගය. Speed.
වෙජ්ජ, පු. වෙද. Physician.
වෙජ්ජකම්ම, න. වෙදකම. Medical treatment.
වෙඨෙති = වෙළයි. He twists or wraps.

වෙණුගුම්බ, පු. උණ පඳුර. A thicket of bamboos,
වෙණුබලි, පු. උණගස් දීමෙන් ගෙවියයුතු බද්ද. A tax to be paid [in bamboo.
වෙත්තග්ග, න. වේවැල් අග. The tip of a cane.
වෙතන, න. පඩිය; කුලිය. Wages.
වෙලා, ඉ. වෙලාව. Time.
වෙහාස, පු. අහස. The sky.
වො = තොපට; තොපගේ; තොප විසින්. To, of, or by you.
වොහාර, පු. වෙළඳාම; ව්‍යවහාරය. Trade; usage.
ව්‍යඤ්ජන, න. අකුර; ව්‍යංජනය. A letter (in the alphabet); a curry.
සක, 3. ස්වකීය; තමා අයත්. One's own.
සකට, පු. න. කරත්තය. A cart.
සකටභිත්තභණ්ඩ, පු. ගැලබුන්කඩ නම් තැන. Name of a place in [Ruhuna.
සකුණසංඝ, පු. සක්ෂි සමූහය. A flock of birds.
සක්ක, පු. ශක්‍රයා. Sakka, the king of devas.
සක්කත, 3. සත්කාර කරනලද. Honoured by.
සක්කභවන, න. ශක්‍ර භවනය. Sakka's abode.
සක්කරොති = සත්කාර කරයි. Treats with kindness.
සක්ඛරා, ඉ. හකුරු; ගල්කැට. Juggery or gravel.
සක්ඛරාපානක, න. හකුරු දමා සෑදූ බීම. A drink made with juggery.
සක්ඛි, ක්‍රි. හැකිවිය. He was able.
සක්ඛිස්සති = හැකිවන්නේය. He will be able.
සක්‍යකුල, න. ශාක්‍යවංශය. The Sakya-clan.
සක්‍යපුත්ති, පු. ශාක්‍ය පුත්‍රයා. Son of a Sakyan.
සංකාරකූට, පු. කසළ ගොඩ. Rubbish heap.
සංඛලිකා, ඉ. මාංචුව. A fetter.
සංඛිත්ත, 3. ලුහුඬු කළ. Abridged.
සංගති, ඉ. එක්වීම Union with.
සංගීති, ඉ. එක්ව කීම; සංගායනාව. Rehearsal in a convocation.
සචෙ, නි. ඉදින් If.
සච්ච, න. සත්‍යය. Truth.
සච්චකාර, පු. ඇපය; අත්තිකාරම. A surety or bail.
සජ්ජෙත්වා = සද, සරසා. Having prepared or decked.
සඤ්ඡන්න, 3. ගවැසීගත්. Covered with; full of.
සඤ්ජානනක, 3. හඳුනන්නා. One who recognizes.
සඤ්ජානාති = හඳුනයි. He recognizes.
සඤ්ඤා, ඉ. සංඥාව; ලකුණ. A sign; perception.
සඤ්ඤාණ, න. ලකුණ. A mark.

සඤ්ඤාපෙත්වා = අවබෝධ කරවා. Having convinced.
සට්ඨියොජනික, 3. හැටයොදුන් පමණැති. Having sixty leagues in
සණ්ඨපෙසි = තැන්පත් කෙළේය. Kept in order. [extent.
සණ්ඨාසි = සිටියේය; පිහිටියේය. It stood or was eastablished.
සණ්ඩ, පු. ලැහැබ. A thicket.
සණ්ඩාස, පු. අඬුව Pincers.
සත, න. සියය. A hundred; 3. සිහිඇති. mindful.
සතවය, න. දෙසියය. Two hundred.
සතමත්ත, 3. සියයක් පමණ. About a hundred.
සතසහස්ස, න. ලක්ෂය. A hundred thousand.
සති, ඉ. සිහිය. Memory.
සති (සන්ත-ශබ්දයෙන්) = ඇති කල්හි. When it is.
සත්ත, පු. සත්වයා. A being.
සත්තධා, නි. සත් ආකාරයකින්. In seven ways.
සත්තපදවීතිහාර, පු. සත් පියවරක් යාම. Going on seven steps.
සත්තභූමක, 3. සත්මහලක් ඇති. Havig seven stories.
සත්තම, 3. හත්වෙනි. Seventh.
සත්තරතන, න. සත්රුවන්. Seven kinds of precious things.
සත්තයොජනික, 3. සත්යොදුන් ඇති. Having seven leagues in height or length.
සත්තවස්සික, 3. සත් හවුරුදු ඇති. Seven eyars old.
සත්තහත්ථ, 3. සත්රියන් දිගැති. Seven cubits in length.
සත්තාහ, න. සතිය. A week.
සත්තිපඤ්ජර, පු. ශස්ත්‍ර ආවරණය. Lattice work of spears.
සත්තූපඝාතක, න. සතුරන් නැසීම. Destruction of enemies.
සත්ථ, න. ශාස්ත්‍රය; ආයුධය. A weapon; a science.
සත්ථා (සත්ථු-ශබ්ද) = ගුරුවරයා; බුදුරද. The teacher.
සද, නි. හැමකල්හි. Ever; always.
සද්ද, පු. ශබ්දය. Sound.
සද්දහති = අදහයි; විශ්වාසකරයි. He believes.
සද්දහාපෙන්ත, 3. විශ්වාස කරවන. Making to believe.
සද්දහිත්වා = අදහා. Having believed.
සද්දායන්ත, 3. ශබ්ද කරමින්. Making a sound.
සද්ධිවිහාරික, පු. සමග වසන්නා. Co-resident (pupil).
සනිකං, ක්‍රි. වි. සෙමින්. Slowly.
සන්ත, 3. විද්‍යමාන; ශාන්ත. Existing; tranquil.
සන්තක, න. අයිති දෙය. 3. අයිති. Possession; belonging to.

සන්තජ්ජෙත්වා = තර්ජනයකොට. Having threatened
සන්තජ්ජෙසි = තර්ජන කෙළේය. He threatened.
සන්ථව, පු. සේවනය. Acquaintance.
සන්ථාගාර, න. නගරශාලාව. Council hall.
සන්ධාය, නි. සඳහා With reference to.
සන්ධාරෙතුං, නි. උසුළන්ට. To hold or bear.
සන්නද්ධ, 3. යුධ ඇඳුම් ඇඳගත්. Donned with armour.
සන්නය්හිත්වා = ඇඳගෙන. Being armed with.
සන්නිධිට්ඨාන, න. රැස්කරන තැන. Hoarding place.
සන්නිපති = රැස්විය. Assembled.
සන්නිපතිත, 3. රැස්වූ. Come together.
සන්නිපතිතභාව, පු. රැස්වූ බව. The fact that they have assembled.
සන්නිපාත, පු. රැස්වීම. Assembly.
සන්නිසින්න, 3. සන්හුන්. Calm; settled.
සන්නිවාස, පු. එකට විසීම. Living together.
සපුත්ත, පු. ස්වකීය පුත්‍රයා. One's own son.
සප්පභාව, පු. සර්පයකු බව. The fact that it is a serpent.
සබ්බකාල, පු. සියලු කාලය. Whole period.
සබ්බට්ඨක, 3. සියලු දෙයින් අට බැගින් ඇති. Consisting eight of every thing.
සබ්බථා, නි. සියලු ආකාරයෙන්. In every way.
සබ්බපඨම, 3. සියල්ලට පළමුවූ. Foremost; very first.
සබ්බපච්ඡා, නි. සියල්ලට පසුව. After all.
සබ්බසත, 3. හැමදෙයින් සියය බැගින් ඇති. Consisting a hundred of each.
සබ්බසසහරණ, න. සියලු සම්පත් පැහැරගැනීම. Confiscation of ones whole property.
සබ්බාලඞ්කාර, පු. හැම ආභරණය. Every ornament.
සභණ්ඩ, 3. බඩු සහිත. Together with goods.
සම, 3. සමානවූ. Equal. සමවූ. even.
සමග්ග, 3. සමගිවූ. United.
සමග්ගවාස, පු. සමගිව විසීම. Living in peace.
සමණධම්ම, පු. මහණකම. Duties of a monk.
සමණභාව, පු. ශ්‍රමණ බව. Monkhood.
සමණසාරුප්ප, 3. ශ්‍රමණයාට සුදුසු. Suited for a monk.
සමත්ථ, 3. හැකි; දක්ෂ. Able; clever.
සමය, පු. කාලය; ආගම. Time; religion.
සමස්සාසෙසි = අස්වැසිය. He consoled.

සමාකුල, 3. ගැවසීගත්. Crowded with.
සමාන, 3. සමානවූ. Equal.
සමානරූප, 3. නොවෙනස් රූප ඇති. Equal in appearance.
සමානෙත්වා = සමානකොට. Having compared.
සමාවහන්ත, 3. හමන; ගෙනැවිත් දෙන. Blowing. bringing near.
සමුදයධම්ම, 3. හටගන්නා සවභාව ඇති. Having the nature of [originating.
සම්පජාන, 3. මනාසේ දන්නා. Knowing well.
සම්පටිච්ඡි = පිළිගත්තේය. He accepted.
සම්පටිච්ඡිත, 3. පිළිගත්. Accepted.
සම්පත්ත, 3. පැමිණි. Reached; arrived.
සම්පන්න, 3. යුක්තවූ. Endowed with.
සම්පරිවාරයිත්වා = පිරිවරාගෙන. Having surrounded (someone).
සම්පරිකිණ්ණ, 3. ගැවසීගත්. Scattered all over.
සම්පස්සන්ත, 3. බලමින්. Looking to.
සම්පාපුණි = පැමිණියේය. He arrived.
සම්බහුල, 3. බොහෝ. Many.
සම්බාධට්ඨාන, න. ඉඩ නැති තැන. Inconvenient or narrow place.
සම්බාහන්ත, 3. මඩිමින්; අතගාමින්. Stroking.
සම්භව, 3. හටගත්. Born from.
සම්ම, (ආලපන) = යහලුව. Dear friend!
සම්මජ්ජි = ඇමැද්දේය. He swept.
සම්මජ්ජිත්වා = අතුගා; පිසදමා. Having swept.
සම්මන්තෙත්වා = සාකච්ඡාකොට. Having discussed.
සම්මා, නි. මනාසේ. Well; rightly.
සම්මාන, න. ගෞරවය. Honour; respect.
සම්මිඤ්ජිත, න. අත්පා හැකිළීම. Bending of a limb.
සම්මුඛීභාව, පු. හමුවීම. Confrontation.
සම්මුඛීභූතත්තා, නි. හමුවූ බැවින්. Because one has met with [or is present.
සම්මුස්සති = මුළාවේ. He becomes forgetful.
සම්මොදනීය, 3. සතුටු වියයුතු. Enjoyable.
සම්මොදමාන, 3. සතුටුවෙමින්. Enjoying.
සම්මොදි = සතුටු විය. He delighted.
සයන්ත, 3. නිදන; නිදමින්. Sleeping.
සයං, නි. තෙමේ. Oneself. තමා විසින්. By one self.
සයාපෙත්වා = නිදිකරවා. Having made to lie down.
සයාපෙස්සති = හොවන්නේය. He will make lie down.
සර, පු. හඬ, ඊතලය, විල. Sound; an arrow; a lake.

සරතීර, න. විල් ඉවුර. Embankment of a lake.
සරතුණ්ඩ, න. ඊයේ තුඩ. Tip or shaft of an arrow.
සරතෙ, ක්‍රි. සිහිකරයි. He remembers.
සරන්ත, 3. සිහිකරන; සිහිකරමින්. Recollecting.
සරපරියන්ත, න. විලේ කෙළවර. The edge of a lake.
සරසම්පන්න, 3. මිහිරි හඬින් යුත්. Sweet-voiced.
සරීරකිච්ච, න. මල පහකිරීමාදිය හෝ මළ සිරුර පිළිබඳ වැඩ. Bodily function; obsequies.
සරීරනිස්සන්ද, පු. මලමූත්‍ර. Excrements of the body.
සරීරානි, (න. බ.) ශරීර ධාතූහු. The bodily relics.
සල්ලක, පු. ඉත්තෑවා. Porcupine.
සල්ලක්ඛිත, 3. සලකනලද. Considered by.
සල්ලක්ඛෙත්වා = සලකා. Having considered.
සල්ලපන්ත, 3. කථාකරන. Speaking to.
සල්ලපිතුං, නි. කථාකරන්ට. To speak to.
සහස්සභණ්ඩිකා, ඉ. කහවණු දසහක් ඇති පොදිය. A parcel of one thousand kahapanas.
සහාය, සහායක, පු. මිත්‍රයා. A friend.
සහායතා, ඉ. මිත්‍රබව. Friendship.
සහි = ඉවසුවේය; හැකිවිය. He endured or was able.
සංවච්ඡර, න. පු. අවුරුද්ද. Year.
සංවර, පු. ආවරණය; වැසීම. Restraint.
සංවසන්තී, ඉ. සමග වසන්නී. (A woman) living together.
සංවිදහි, ක්‍රි. විධාන කෙළේය. He arranged.
සංසග්ග, පු. ආශ්‍රය. Contact; association.
සංසන්දෙත්වා = ගළපා බලා. Having compared with.
සංහරිත්වා = අකුලා. Having folded up.
සා, පු. බල්ලා. Dog.
සාකටික, පු. කරත්ත පදවන්නා. A carter.
සාකුණික, පු. පක්ෂි වැද්ද. A fowler.
සාඛන්තර, න. අතු අතර. In between of the branches.
සාඛාභඞ්ග, පු. කැඩූ අත්ත. Faggots or foliage.
සාටක, පු. න. වස්ත්‍රය. A clothe.
සාණි, ඉ. තිරය. A curtain.
සාධු, නි. යෙහෙකි. It is good.
සාධුක, 3. යහපත්. Good.
සාපතෙය්‍ය, න. සම්පත; ධනය. Wealth.

(9)

සාමග්ගී, ඉ. සමගිය. Unity.
සාමඤ්ඤ, න. ශ්‍රමණ භාවය. Monkhood.
සාමණේර, පු. හෙරණ. Novice monk.
සාමිපුත්ත, පු. ස්වාමියාගේ පුත්‍රා. Master's son.
සායණ්හසමය, පු. සවස්කාලය. Evening.
සාරණීය, 3. සිහිකටයුතු. Memorable.
සාලරුක්ඛ, පු. සල්ගස. Sal tree.
සාලවන, න. සල් වනය. Sal grove.
සාලා, ඉ. ශාලාව. A hall.
සාලිත්තකසිප්ප, න. ගල් විදින ශිල්පය. The art of slinging stones.
සාලොහිත, පු. ලේ නෑයා. A blood-relation.
සාවත්ථි, ඉ. සැවැත්නුවර. The city of Savatthi.
සාසන, න. පණිවිඩය; ලියුම; ධර්මය. A message; a letter; teaching.
සාළිකපොතක, පු. සැළලිහිණි පැටියා. A young one of a Sarika or [Maina.
සික්ඛති = ඉගෙනගනී. He learns.
සික්ඛාපෙති = උගන්වයි. He teaches.
සික්ඛිත්වා = ඉගෙන. Having studied.
සිඛී, පු. කුඩුම්බි ඇත්තා; මොනරා. One who has a top-knot; a [peacock.
සිගාල, පු. සිවලා. Fox.
සිත, න. මද සිනාව. A smile.
සිතකාරණ, න. සිනාවට හේතුව. Cause for a smile.
සිතාකාර, පු. ප්‍රීතිමත් ආකාරය. Joyful attitude.
සිද්ධත්ථක, පු. අබ. Mustard seed.
සිද්ධි, ඉ. සිඩවීම; අභිවෘද්ධිය. Occurrence; welfare.
සිප්ප, න. ශිල්පය. Art.
සිප්පිකා, ඉ. සිප්පිකටුව; කවඩියා. Cowry shell.
සිර, පු. න. හිස. The head.
සිරිගබ්භ, පු. උතුම් කාමරය. Stately room.
සිරිසයන, න. උතුම් ඇඳ. State bed.
සිරිසොභග්ග, න. සම්පත හා ආනුභාව. Wealth and splendour.
සිවිකා, ඉ. සිවිගෙය; දෝලාව. A palanquin.
සීඝසීඝං, ක්‍රි. වි. වහ වහා. Very quickly.
සීත, 3. සිහිල්. න. සීතල. Cool; cold.
සීවථිකා, ඉ. අමුසොහොන. A place where dead bodies are [thrown to rot away.
සීසකපාල, පු. හිස්කබල. The skull.
සීහනාද, පු. සිංහනාදය; ශ්‍රෙෂ්ඨ කථාව. Lion's roar.
සීහසෙය්‍යා, ඉ. සිංහයාගේ නිදීම. Lying like a lion.

සුකර, 3. පහසු. Easy to do.
සුඛසම්ඵස්ස, 3. සැපපහස් ඇති. Having a comfortable touch.
සුඛී, 3. සුවපත් අය. One who is happy.
සුඛීකරොති = සුවපත් කරයි. Makes happy or cures.
සුඛුම, 3. සියුම්. Fine; subtle.
සුගහණ, න. යහපත් ඇල්ලීම. A safe grip.
සුගහිතං, ක්‍රි. වි. මනාසේ ඇල්ලුවක් කොට. (Held) in a safe way.
සුට්ඨු, නි. මනාසේ. Well; in a good manner.
සුණන්ත, 3. අසන; අසමින්. Hearing.
සුණිසා, ඉ. ලේලි. Daughter-in-law.
සුණොම = අසමු. We hear.
සුත, පු. පුත්‍රයා. Son. 3. අසනලද. heard.
සුතපුබ්බ, 3. අසා පුරුදු ඇති. Heard before.
සුධචිත්ත, 3. පිරිසිදු සිතැති. Of clean mind.
සුනඛලුද්දක, පු. බලු වැද්ද. One who hunts with dogs.
සුන්දර, 3, යහපත්. Good.
සුමනපට්ටවිතාන, න. සමන් මලින් කළ වියන. An awning of [jasmine.
සුමනා, ඉ. සමන් මල්. Jasmine.
සුභ. 3. යහපත්. Good.
සුරා, ඉ. මත්පැන්. Spirituous liquor.
සුරාපීත, 3. මත්පැන් පානයකළ. One who is drunk.
සුරාමද, පු. රා මත. Tipsiness; intoxication.
සුරාවාරක න. රා භාජනය. A jug of liquor.
සුරාසොණ්ඩ, 3. සුරාවෙහි ලොල් අය. Addicted to liquor.
සුරියත්ථංගමන, න. හිර බැසීම. Setting of the sun.
සුරියුග්ගමන, න. හිරු නැගීම, Rising of the sun.
සුවණ්ණකාර, පු. රන්කරුවා. Goldsmith.
සුවණ්ණජාල, න. රන්දැල. A golden net.
සුසජ්ජිත, 3. මනාසේ සැරසූ. Well decked.
සුසංවිහිත, 3. මනාසේ යෙදූ. Well arranged.
සුසාන, න. සොහොන. Cemetery.
සුසානවන, න. සොහොන අසළ වනය. Forest near a cemetery.
සුසික්ඛිත, 3 මනාසේ උගත්. Well-versed; experienced.
සුසිර, න. සිදුර. Hollow of a tree.
සුසෙදිත, 3. මනාසේ තවනලද. Well moistened.
සුහජ්ජ, සුහද, පු. මිත්‍රයා. A friend.
සූචි, ඉ. ඉදිකටුව. Needle.

සෙට්ඨිකුල, න. සිටු පවුල. Family of a millionaire.
සෙට්ඨිජායා, සෙට්ඨිභරියා, ඉ. සිටු භාර්‍යාව. Wife of a millionaire.
සෙට්ඨිට්ඨාන, න. සිටු තනතුර. Office of treasurer.
සෙට්ඨිභාව, පු. සිටු බව. State of a treasurer.
සෙතච්ඡත්ත, න. සුදු කුඩය. White parasol.
සෙතපදුම, න. හෙළපියුම. White lotus.
සෙති = නිදයි. He sleeps.
සෙන, පු. උකුස්සා. A hawk.
සෙනා, ඉ. භට සේනාව. An army.
සෙනඞ්ග, න. සෙනඟ. Divisions of an army.
සෙස, 3. ඉතිරි. Remaining; the other.
සොකාතුර, 3. ශෝකයෙන් පෙළුණු. Overcome with grief.
සොචති = ශෝකකරයි. He grieves.
සොණ්ඩි, ඉ. ගල්පොකුණ. Rock-pool.
සොතුං, නි. අසන්ට. To hear.
සොත්ථිභාව, පු. සුවපත් බව. Safety.
සොධෙති = ශුද්ධකරයි. He cleans.
සොභග්ග, න. සෞභාග්‍යය. Splendour; beauty.
සොමනස්ස, න. සතුට. Joy; gladness.
සොමනස්සජාත, 3. සතුටුවූ. Glad; joyful.
සොළසවස්සුද්දෙස, 3. සොළොස් අවුරුදු වයස. The age of sixteen.
ස්වාක්ඛාත, 3. මනාසේ දෙසූ. Well preached.
හට, 3. ගෙනයනලද. Carried away.
හටභාව, පු. ගෙනගිය බව. The fact that something was carried away.
හට්ඨතුට්ඨ, 3. තුටුපහටුවූ. Joyful and happy.
හත්ථගත, 3. අතට පැමිණි. Come into possession.
හත්ථපාස, පු. අතපොවන හරිය. Distance of the hand.
හත්ථිගණ, පු. ඇත් සමූහය. A herd of elephants.
හත්ථිච්ඡාප, පු. ඇත් පැටවා. Young elephant.
හත්ථිරාජ, පු. ඇත්රජා. Elephant king.
හත්ථිරූපක, න. ඇත්රූපය. Picture of an elephant.
හදය, න. හෘදය. The heart.
හනන්ත, 3. නසන; නසමින්. Killing.
හන්ද, නි. එසේනම්. Well then.
හරණත්ථං = දුරුකිරීම පිණිස. To remove.
හලාහලවිස, න. ඉතා දරුණු විෂය. Deadly poison.
හසිත්වා = සිනාසී. Having laughed.

හානි, ඉ. පිරිහීම. Loss.
හාසයමාන, 3. සතුටුකරවමින්. Making joyful.
හිත, පු. න. යහපත. Welfare.
හිතෙසී, පු. වැඩ කැමැත්තා. One who wishes welfare.
හිරඤ්ඤ, න්. අමු රන්. Unwrought gold.
හිරිකොපීන, න. ලජ්ජාව කෝප කරවන අවයව. The male or [female organ.
හිරිසංවර, පු. ලජ්ජාව වැසීම. To hide one's shame.
හෙට්ඨාභාග, පු. යට කොටස. The lower part.
හෙට්ඨාමඤ්ච, පු. ඇඳ යට. Underneath a bed. යට මැස්ස. A lower [stage.
හෙතු, පු. කාරණය. Cause; reason.
හෙතුප්පභව, 3. හේතුවෙන් හටගත්. Originated by a cause.
හෙමසඞ්ඛලි, ඉ. රන් මාංචුව. Fetters of gold.
හෙස්සති = වන්නේය. It will be.
හොතු = වේවා. Be it so.
හොන්තා, 3. වෙමින්. Being or becoming.

# ගැටපදය

සිට. පෙ.

1- 6 **න දින්නපුබ්බං** = නුදුන්විරූය; නොදෙන ලද්දේය.

1-29 **අක්ඛීහි න පස්සාමි** = ඇස්වලින් නොදකිමි. (මගේ ඇස් නොපෙනෙති යන අදහසයි.)

3-20 **එකවචනෙනෙ'ව පක්කන්දිතබ්බා** = එකවචනයෙන් ම පැන දුවලා. (දෙවරක් කියන තෙක් නොසිට දුවගොස්.)

4-14 **අක්ඛිං භින්දි** = ඇසක් බින්දේය; තුවාළ කෙළේය.

4-19 **මයා කතඤ්ඤුනා භවිතබ්බන්ති** = මා කළගුණ සලකන්නකු වියයුතුයයි.

4-33 **තිරච්ඡානගතෙහි'පි ගුණහීනා'ති** = තිරිසනුන්ටත් වඩා ගුණයෙන් අඩුවූවෝ යයි. මෙහි වඩා යන අර්ථය ලැබෙන්නේ ''තිරච්ඡානගතෙහි'' යන තැන පඤ්චමී විභක්තියෙනි.

11-28 **නක්ඛත්තං ඝුට්ඨං** = නැකතක් ඝෝෂණය කරනලදී. නැකැත් සම්බන්ධ උත්සවයක් පැවැත්වීමට දැනුම්දෙන ලදී.

12-26 **සිප්පිකානං සතං** = සිප්පිකටු සියයක් (පෙර මුදල් වෙනුවට කවඩි හා සිප්පිකටු පාවිච්චි කරනලදී.)

12-27 **කංසසතා ද්වෙ** = (මිශ්‍ර ලෝහයෙන් කළ) කාසි දෙසියයක්. (සත–ශබ්දය එකවචනාන්තවූ නමුත් වෙන්වූ රාශි වශයෙන් දක්වීමේදී බහුවචනය ගනී.

13- 4 **''ධනං''** යන්න සමූහාර්ථයෙහි එකවචනයි. **අඩ්ඪාරා** යන්න වෙන් වෙන් ද්‍රව්‍යවශයෙන් සලකා බහුවචනයෙන් යොදන ලදී.

15-25 **තස්ස පුනප්පුනං කථෙන්තස්සාපි** = ඔහු නැවත නැවත කියන කල්හිත්. (අනාදරාර්ථයෙහි ෂෂ්ඨියයි.)

15-30 **කිම්මෙ සමණභාවෙන** = මට ශ්‍රමණභාවයෙන් ඇති ඵලය කිමෙක්ද? (මට මහණකම කුමටද? යන අදහසයි.)

16- 4 **කිං තෙ පුත්තෙන ගහිතෙන** = ගන්නාලද පුත්‍රයාගෙන් ඔබට කම් කිම? (පුත්‍රයා ගැනීමෙන් ඔබට ඇති ඵලය කිම?)

පිට පෙ.

17-11 **අග්ගිං.........උජ්ජාලෙසි** = ගිනි දල්වන්ට නොහැකිවන්නී හිරු නැංවිය. (හිරු නැංවීම ඇය විසින් කරන ලද්දක් නොවේ; හිරු නගිනතෙක් ගිනි දල්වාගන්ට ඕ අසමර්ථවී යයි මෙයින් අදහස්කරන ලදී.)

18-12 **ගුම්බතො ජාලං මොචෙන්තස්සෙව** = ලැහැබෙන් දල මුද ගන්නා කල්හිම (කාලාර්ථයෙහි ෂෂ්ඨියයි.)

20-28 **නතිශෙන පරිහාරේන** = "පරිහාර" නම් පඬුවුඩ ගෙන යන්නායි. මේ මහ වෙළඳකු මෙන් පෙනී සිටි පුරුෂයා සමීපයෙහි එක් සේවකයෙක් ද ඔහුට දුරින් තවත් සේවක යෙක්ද ඔහුටත් දුරින් තවත් අයෙක් ද යි මුරකරුවෝ තිදෙනෙක් වූහ. පිටතින් පැමිණියකු දුරින්ම සිටින සේවකයාට දුන්නුවිට හෙතෙම දෙවැන්නාට ද දෙවැන්නා තුන්වැන්නාට ද දන්වයි. තුන්වැන්නා මහ වෙළඳනැනට දනුම්දෙයි. මෙසේ කරනලද්දේ මහ ධනවතකු බව පෙන් වීමටයි.

21-17 **ඨපෙත්වා යථාසුඛපරිභොගං** = පහසු පරිදි හෝ කැමති පරිදි පාවිච්චි කිරීම මිස.

21-23 **වෙඅසීතිකොටි ධනං** = අසූකෝටි දෙකක් ධනය.

21-30 **තස්ස රාජකුලතො ආගච්ඡන්තස්ස** = ඔහු රජගෙයින් එන කල්හි.

25-14 **තං තං ගන්ත්වා ගණ්හාති** = ඒ ඒ අය වෙත ගොස් අල්වා ගනියි.

28-25 **මච්ඡානං චින්තනකබකො**=මසුන් ගැන (අනුකම්පාවෙන්) සිතන කොකෙක්.

29-15 **එතං කුසලං** = මෙය යහපති.

35-23 **සකලගාමං ආහිණ්ඩිත්වා** = මුළු ගමෙහි ඇවිද.

37-23 **කාලකණ්ණිං පවාහෙස්සාමි** = අශුභ කාරණය දුරු කරන් නෙමි. (සෝද හරින්නෙමි.)

41-21 **ආවාපං ආලිම්පෙස්සසි** = පෝරණුයට ගිනි දමන්නෙහිද?

41-36 **ඉමෙ මං දරකා බහුං ලක්ඛං ජිනිංසු** = මේ ළමයි මා (පරදවා) බොහෝ ඉලක්ක දිනූහ.

42- 2 **බහුං හි ජිනිතො** = බොහෝසේ පරදවන ලද්දේ වෙමි.

42-12 **බාහා පග්ගය්හ කන්දන්තා** = හිසැ අත්බැඳගෙන හඬමින්.

පිට පෙ.

43–10 **තිඪ්තු පෙසනං** = පණිවුඩය තිබේවා. (නවතීවා )

43–22 **පුබ්බෙ ච සන්නිවාසෙන** = පෙර එක්ව විසීමෙන් හෝ

43–22 **පච්චුප්පන්නහිතෙන වා** = මේ භවයේදී කළ උපකාරයක් නිසා හෝ.

43–27 **මාතාපිතුන්නං අස්සුදිඩ්ගිතතාය අපස්සන්තානං ඕප රිත්වා** = මවුපියන් අත් වැඩවල යෙදී සිටි බැවින් ඔවුන නොදක්නා කල්හි බීමට බැස.

46–11 **යථා පුරෙ** = පෙර මෙන්.

46–13 **සබ්බසතෙන** = සියල්ලෙන් සියය බැගින් දීම සමග..

46–28 **මූලෙන ගණ්හථ** = මුදලෙන් ගනිව්. (මුදල් දී ගනිව් )

46–29 **සතෙන දෙථ** = (කහවණු) සියයකින් දෙව්. (කහවණු 100 ක් ගෙන දෙව්.)

47– 2 **අච්ඡරාසඞ්ඝාත වස්සති** = අසුරු (ඇඟිලි එක්කොට) ගැසීමෙන් හඬලයි. (අසුර ගැසූවිට හඬලයි.)

47–27 **මාලාගන්ධවිභූතිසම්පන්නං** = මලින් හා සුවඳින් සැරසීමෙන් යුක්තවූ.

49–16 **උතුං ගාහාපෙසුං** = ඍතු ගැන්වූහ. නැවීමෙන් ශීතොෂ්ණයන්ගේ සමත්වය ඇති කළහ.

49–21 **එකඝන ණානි අහෙසුං** = එක් සමභූමියක පිහිටියාහු මෙන් වූහ. (එසේ පෙනී ගියහ.)

51–28 **නච්ච-ගීත-වාදිතානි පයොජෙසුං** = නෘත්‍ය-ගීත-වාද්‍යයන් යෙදවූහ. (නැටුම් ගී කීම් හා තූර්‍ය්‍යනාද පැවැත්වීම කළහ.)

52– 2 **පාකට භීහච්ඡ-සම්බාධට්ඨානා** = ප්‍රකටවූ බිය එළවන ලජ්ජා ස්ථාන ඇත්තියෝ; (නින්දේ දී වස්ත්‍ර ඉවත්වීමෙන් සිදුවූවකි.)

53– 2 **කණ්ඨකනිවත්තන-චෙතියට්ඨානං දස්සෙත්වා** = කණ්ථක නිවර්තන චෛත්‍යස්ථානය දක්වා. (මේ නැවතී බැලූතැන්හි පසුකලක චෛත්‍යයක් ගොඩනංවන ලදී. සිද්ධාර්ථ කුමරුන් තුළ එහි චෛත්‍යයක් බැන්දවීමේ අදහසක් නොතිබුණු නමුත් අටුවා ලියන කාලයෙහි ඒ චෛත්‍යය බැඳ තිබුණු හෙයින් මෙසේ කියනලදී.)

පිට පෙ.

53-18 **අට්ඨුසභවිත්ථාරාය** = ඉස්බ අටක් පළලැති. (ඉස්බක් රියන් 140 කි.)

53-22 **න ලබ්භා තයා පබ්බජිතුං**=තා විසින් පැවිදිවීම නොහැකිය, (තට පැවිදිවන්ට නොලැබේ.) **ලබ්භා** යන්න නිපාතයකි.

54-16 **සබ්බඵාලිඵුල්ලා** = මල් පිපියහැකි සියලු තැන පිපුණු මලින් යුක්තවූවාහු.

55-22 **මල්ලපාමොක්ඛා** = මල්ලයන්ගේ අධිපතිහු.

56-16 **සරීරානෙව අවසිස්සිංසු** = ධාතූහුම ඉතිරිවූහ.

57- 4 **ඉරියාපථසම්පන්නො** = යහපත් ඉරියව්වෙන් යුක්තවූයේ.

57-16 **අප්පිච්ඡෙහි උපඤ්ඤාතං මග්ගං** = ඔනැකම ඇත්තන් විසින් අනුදත් (පිළිගත්) මග හෙවත් ආකාරය.

60-10 **සත්ත ච මෙ වස්සානි අධීයන්තස්ස** = ඉගෙනගන්නා මට සත් වසක් (ඉක්මුණාහ.)

60-32 **න සුකරා අපාථෙය්‍යෙන ගන්තුං** = මාර්ගෝපකරණ නැත්තහු විසින් යාම අපහසුය.

61-12 **නත්ථුතො අදාසි** = නාසයෙහි වත්කෙළේය; නස්‍යයක් වශයෙන් දුන්නේය.

62- 6 **උපරජ්ජට්ඨපනාය** = යුවරජු තැබීම පිණිස.

62-11 **සදාර-බලවාහනො** = භාර්‍යාව හා භටපිරිස ද රථාදිය ද ඇත්තේ.

64- 5 **හත්ථස්සථරුකම්මස්ස කුසලො කතූපාසනො** = ඇතුන් අසුන් පිට යාමෙහි ද කඩුශිල්පයෙහි ද දක්‍ෂවූයේ, කළ පුරුදු ඇත්තේ;

64 **34 වෙනි ගාථාවේ භාවය:**

මාගේ පියා පුරුෂයෙක් වේ නම් මෙසේ නොකියයි; එහෙයින් "මේ ආභරණ පැළඳගනීවා"යි කියා ඒ කුමාර තෙමේ ඔහට (පියරජුට) ස්ත්‍රීන්ගේ ආභරණ යැවීය.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු